tamilguru.lk



# තනතුරු ඇබෑර්තු

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (දෙපාර්තමේන්තුගත) සේවා ගණයේ තනතුරු සඳහා බඳවාගැනීම - 2025

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (දෙපාර්තමේන්තුගත) සේවා ගණයේ (MN - 3 - 2025) පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් **2025.12.19** දිනට පහත 3.0 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවාගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | කීට විද්‍යා සහකාර | 01 |
| 02. | සත්ත්ව විද්‍යා සහකාර | 01 |
| 03. | උද්භිද විද්‍යා සහකාර | 01 |
| 04. | භූ විද්‍යා සහකාර | 01 |
| 05. | කෞතුකාගාර ආරක්ෂක (Curator) | 06 |
| 06. | කාර්මික නිලධාරී (සැලසුම්) | 02 |
| 07. | කාර්මික නිලධාරී (විදුලි) | 01 |
| 08. | ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකක භාර නිලධාරී | 01 |

1.2 තනතුරුවල රාජකාරී ස්වභාවය :

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| කීට විද්‍යා සහකාර | කීට විද්‍යා අංශයට අයත් භාණ්ඩ හා නිදර්ශක ලේඛනගතකර පවත්වාගෙන යාම හා එම භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ කීට විද්‍යා වෙත වගකීම. |
| සත්ත්ව විද්‍යා සහකාර | සත්ත්ව විද්‍යා අංශයට අයත් භාණ්ඩ හා නිදර්ශක ලේඛනගතකර පවත්වාගෙන යාම හා එම භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ සත්ත්ව විද්‍යා වෙත වගකීම. |
| උද්භිද විද්‍යා සහකාර | උද්භිද විද්‍යා අංශයට අයත් භාණ්ඩ හා නිදර්ශක ලේඛණගතකර පවත්වාගෙන යාම හා එම භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ උද්භිද විද්‍යා වෙත වගකීම. |
| භූ විද්‍යා සහකාර | භූ විද්‍යා අංශයට අයත් භාණ්ඩ හා නිදර්ශක ලේඛනගතකර පවත්වාගෙන යාම හා එම භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ මානව වංශ විද්‍යා වෙත වගකීම. |
| කෞතුකාගාර ආරක්ෂක (Curator) | ස්වකීය කෞතුකාගාරයේ සහ එයට අයත් භූමියේ පවතින නිශ්චල හා චංචල දේපලවල ආරක්ෂාව සඳහා කෞතුකාගාර ප්‍රධානීන්ට සහාය වීම. |
| කාර්මික නිලධාරී (සැලසුම්) | කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සහ කෞතුකාගාරවල ගොඩනැගිලි ඉදිකිරීම, අලුත්වැඩියාව මෙන්ම ප්‍රදර්ශන ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු, පිරිවිතර සහ ප්‍රමාණපත්‍ර සකස්කිරීම සඳහා කෞතුකාගාර ප්‍රධානීන්ට සහාය වීම. වැඩ පරීක්ෂා කිරීම හා අධීක්ෂණය වැඩබිම් පාලනය හා සේවා නඩත්තුව. |

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| කාර්මික නිලධාරි (විදුලි) | කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සහ කෞතුකාගාරවල විදුලි නඩත්තු සඳහා කෞතුකාගාර ප්‍රධානීන්ට සහාය වීම, විදුලි කාර්මික වැඩ අධීක්ෂණය.<br>ශ්‍රවණාගාරයේ මයික්‍රො ෆිල්ම (Micro film) හා CCTV පද්ධතියේ දෝෂයක් හට ගත් විට ඒවා අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.<br>දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරී. |
| ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකක භාර නිලධාරි | කෞතුකාගාරයේ සම්මන්ත්‍රණ ශාලාව හා ශ්‍රවණාගාරයේ භාරකාරීත්වය මෙන්ම ඊට අයත් සියලු බඩු භාණ්ඩවල භාරකාරීත්වය දැරීම හා ඒවා නඩත්තු කිරීම. සම්මන්ත්‍රණ ශාලාව හා ශ්‍රවණාගාරයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ක්‍රියාත්මක කරවීම. ශබ්දාගාරයේ පටිගත කිරීම, ක්ෂේත්‍රයේ පටිගතකිරීම සඳහා පරිගණක ආශ්‍රිතව ශබ්ද සැකසීම. (Digital Sound) |

2.0 සේවයට බඳවාගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2.1 3.0 ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

2.2 කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

3.0 සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| කීට විද්‍යා සහකාර | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය ජීව විද්‍යා විෂය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් එකවර සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). (පැරණි විෂය නිර්දේශයේ සත්ත්ව විද්‍යාව විෂය සහිතව විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |
| සත්ත්ව විද්‍යා සහකාර | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය ජීව විද්‍යා විෂය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් එකවර සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). (පැරණි විෂය නිර්දේශයේ සත්ත්ව විද්‍යාව විෂය සහිතව විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |
| උද්භිද විද්‍යා සහකාර | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ ) විභාගය ජීව විද්‍යා විෂය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් එකවර සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). (පැරණි විෂය නිර්දේශයේ උද්භිද විද්‍යාව විෂය සහිතව විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| භූ විද්‍යා සහකාර | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ ) විභාගය ජීව විද්‍යා විෂයය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් එකවර සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). (පැරණි විෂය නිර්දේශයේ විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |
| කෞතුකාගාර ආරක්ෂක (Curator) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය ජීව විද්‍යා විෂයය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් එකවර සමත් වී තිබීම හෝ අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය කලා අංශයෙන් ඉතිහාසය විෂය ඇතුළත්ව විෂයයන් දෙකකින් එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ ඉහත සඳහන් විෂයයන් ඇතුළත්ව විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.) |
| කාර්මික නිලධාරි (සැලසුම්) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත විෂයය ධාරාවට අයත් විෂයයන් දෙකක් එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ ඉහත සඳහන් විෂයයන් ඇතුළත්ව විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.) |
| කාර්මික නිලධාරි (විදුලි) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ ) විභාගය ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත විෂය ධාරාවට අයත් විෂයන් දෙකක් එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ ඉහත සඳහන් විෂයන් ඇතුළත්ව විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.) |
| ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකක භාර නිලධාරි | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ ) විභාගය ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත විෂයය ධාරාවට අයත් විෂයයන් දෙකක් එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ ඉහත සඳහන් විෂයයන් ඇතුළත්ව විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.) |

3.2 වෘත්තීය සුදුසුකම් :

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| කීට විද්‍යා සහකාර | අම්පාර හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) පාඨමාලාව හදාරා තිබීම. |
| සත්ත්ව විද්‍යා සහකාර | අම්පාර හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) පාඨමාලාව හදාරා තිබීම. |
| උද්භිද විද්‍යා සහකාර | අම්පාර හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) පාඨමාලාව හදාරා තිබීම. |
| භූ විද්‍යා සහකාර | මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන භූ ගර්භ විද්‍යාව හෝ රත්න විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව. |
| කාර්මික නිලධාරි (සැලසුම්) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.)අවම වශයෙන් පස්වන මට්ටමට නොඅඩු සිවිල් ඉංජිනේරු,ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ නිපුණතාවයක් ලබාගෙන තිබීම;<br>*හෝ*<br>මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය මගින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු) ඩිප්ලෝමාව හදාරා තිබීම.<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (සිවිල්ඉංජිනේරු) ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 කොටස (සිවිල් ඉංජිනේරු) සාර්ථකව සම්පූර්ණ කිරීම.<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරනු ලබන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| කාර්මික නිලධාරි (විදුලි) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.)අවම වශයෙන් පස්වන මට්ටමට නොඅඩු විදුලි ඉංජිනේරු විෂය පිළිබඳ නිපුණතාවයක් ලබාගෙන තිබීම. |
| ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකක භාර නිලධාරි | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාගත් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ ඩිප්ලෝමාවක් හදාරා තිබීම. |

3.3 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.5 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. සේවයට බඳවා ගැනීම සඳහාවන ලිඛිත විභාගයට සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

4.0 වයස :
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

5.0 සේවයේ අනුයුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

5.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. එතෙකුදු වුවත් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරීන් යටත්විය යුතු ය.

5.2 පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩයිම සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

6.0 වැටුප් ප්‍රමාණය :

මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි MN-3-2025 අනුව

රු. 52,250 – 10 x 800 - 11 x 1, 190 – 10 x 1320 – 10 x 1350 – රු. 100,040 (මාසික)

වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

7.0 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

විභාග පරිපාටිය: විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| I. | බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| II. | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% | පැය 01 |

7.1 විෂය නිර්දේශය :

1. බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත්, විශ්ලේෂණ හැකියාවත්, තීරණ ගැනීමේ හැකියාවත් පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න 40කින් සමන්විත වේ.

11. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය : පොදු සාමාන්‍ය දැනීම ප්‍රශ්න 15ක් සහ එක් එක් තනතුරට අදාළ ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රශ්න 25ක් සහිත බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. විෂයයන්ට අදාළ ක්ෂේත්‍ර පහත පරිදි වේ.

1. කීට විද්‍යා සහකාර: සත්ත්ව රාජධානියේ ආත්‍රපෝඩා වංශයේ (Phylum-Arthropoda) ඉන්සෙක්ටා වර්ගය (Class-Insecta) පිළිබඳ අවබෝධය, පර්යේෂණාගාර උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය සහ පරිසර විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම.

2. සත්ත්ව විද්‍යා සහකාර: සත්ත්ව රාජධානිය පිළිබඳ අවබෝධය, පර්යේෂණාගාර උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය සහ පරිසර විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම.

3. උද්භිද විද්‍යා සහකාර: ශාක රාජධානිය පිළිබඳ අවබෝධය, පර්යේෂණාගාර උපකරණ භාවිතය පිළිබඳ අවබෝධය සහ පරිසර විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම.

4. භූ විද්‍යා සහකාර: භූගෝල විද්‍යාව සහ පාෂාණ විද්‍යාව පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

5. කෞතුකාගාර ආරක්ෂක(Curator) :

විද්‍යා අංශය -: සත්ත්ව විද්‍යාව සහ උද්භිද විද්‍යාව පිළිබඳ මූලික දැනුම
සංස්කෘතික අංශය -: ශ්‍රී ලංකාවේ සංස්කෘතික අංග, සම්ප්‍රදායන් සහ ඉතිහාසය පිළිබඳ මූලික දැනුම.

6. කාර්මික නිලධාරි (සැලසුම්)-: සිවිල් ඉංජිනේරු, ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ මූලික දැනුම හා උපකරණ සහ අදාළ තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

7. කාර්මික නිලධාරි (විදුලි)-: සිවිල් ඉංජිනේරු, ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ මූලික දැනුම හා උපකරණ සහ අදාළ තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

8. ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකක භාර නිලධාරි -: ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ක්‍රියාත්මක කරවීම, ශබ්දාගාරයේ පටිගතකිරීම, ක්ෂේත්‍රයේ පටිගතකිරීම සඳහා පරිගණක ආශ්‍රිතව ශබ්ද සැකසීම පිළිබඳ මූලික දැනුම හා උපකරණ හා අදාළ තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ (MN-3-2025) තනතුරු සඳහා වන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු නොලැබේ. අධ්‍යාපනික හා ශාරීරික යෝග්‍යතාව සනාථ කිරීම පරීක්ෂා කරනු ලැබේ.

***** සැලකිය යුතුයි :***

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

8.0 අයදුම් කිරීමේ ක්‍රමය :

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපැලේ දී අස්ථානගතවන අයදුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.4 සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම, අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.5 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම්කරන තනතුර අනුව **"ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (දෙපාර්තමේන්තුගත) සේවා ගණයේ ................ තනතුරට බඳවා ගැනීම - 2025"** යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය.

8.6 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චය කාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.7 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

9.0 අයදුම්පත් යොමු කිරීම :

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025.12.19 දින හෝ ඊට පෙර** පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය:

අධ්‍යක්ෂ ජනරාල්,<br>
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,<br>
අංක 53,<br>
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,<br>
කොළඹ 07.

10.0 සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවාගැනීමට අපේක්ෂිත

සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවකට සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට සතියකට පෙර ලැබෙන සේ කැඳවීමේ ලිපි නිකුත් කරනු ඇත.

කැඳවීමේ ලිපිය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත:

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,

III. වලංගු රියදුරු බලපත්‍රය.

12.0 සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :

යම් අපේක්ෂකයෙකුට මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරේ දී හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13.0 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියෙහි හා ඊට සිදුකර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

14.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15.0 මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

සනුජා කස්තුරිආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

2025 නොවැම්බර් මස 25 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ...................
.......................... තනතුර සඳහා බඳවා ගැනීම - 2025

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

1.0

1.1 මුලකුරු සමග නම : (මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා:* PERERA A.B.C
..........................................................................................................................................
..........................................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
..........................................................................................................................................
..........................................................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්) ..........................................................................................................
..........................................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

1.5 උපන්දිනය :

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

1.5 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු: | | | | | මාස: | | | දින: | | |

1.6 ස්ත්‍රී/ පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F) | |

1.7 විවාහක / අවිවාහක බව : විවාහක : | | අවිවාහක : | |

(√ ලකුණ යොදන්න)

2.0 ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..........................................................................................................
..........................................................................................................................................

2.2 සිංහලෙන්/ දෙමළෙන් : ..........................................................................................................
..........................................................................................................................................

2.3 කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය : ..........................................................................................................
..........................................................................................................................................

3.0 ස්ථිර පදිංචියට අයත් :

3.1 පළාත් සභාව : ..........................................................................................................
3.2 දිස්ත්‍රික්කය : ..........................................................................................................

4.0 දුරකතන අංකය :

ස්ථාවර: | | ජංගම: | |

5.0 අධ්‍යාපන සුදුසුකම් :

1. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

*වර්ෂය:* ................................................ *විභාග අංකය* : ...................................

| *සමත් වූ විෂයය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

| *සමත් වූ විෂයය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

2. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) :
*වර්ෂය:* ................................................. *විභාග අංකය :* ...................................

| *සමත් වූ විෂය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකපත්වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතු ය)

6.0 වෘත්තීය සුදුසුකම්:

| *හදාරා ඇති පාඨමාලාව* | *ආයතනය* | *ලබා ඇති වෘත්තීය මට්ටම* | *පාඨමාලාව සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

7.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(√ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

7.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ........................................................................................................................
........................................................................................................................................................

8.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) තව ද යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.........................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ............................................

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය ................................... දින මා ඉදිරිපිට දී ඉහත 8.0 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

............................................................,
සහතික කරන්නාගේ අත්සන.

දිනය : .............................................
සහතික කරන්නාගේ නම : ..........................................
තනතුර : ...............................................................
ලිපිනය : ...............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12 - 44